**තඹලගමුව ප්‍රාදේශීය සභාව - 2022**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තඹලගමුව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තඹලගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ රු.143,000 කට මිලදී ගත් මුද්‍රණ යන්ත්‍ර 02 ක වටිනාකමක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු පොලී රු.180,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙහි නිවැරදි කරන බව. | ණය හා පොලී නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | පළාත් පාලන ආයතනවල ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතිය යටතේ සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ලැබුණු රු.144,750 ක් සමාලෝචිත වර්ෂයේ නියමිත අරමුණු සඳහා වැය නොකර වියදමක් හා ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා තිබුණි. | රටෙහි ඇති වූ තත්ත්වය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ නොහැකි වූ බව. | ආධාර අදාළ අරමුණු සඳහා යොදා ගත යුතුය. |
| (ඈ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව සහ නැගෙනහිර ප්‍රධාන අමාත්‍ය කාර්යාල විසින් සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග කළ එකතුව රු. 718,234 ක භාණ්ඩවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | මේ වන විට ගිණුම්ගත කර ඇති බව. | අදාළ වර්ෂය තුළ ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් හිමිකම් ඔප්පු සහ ස්ථාවර වත්කම් ලේඛන නොතිබීම හේතුවෙන් රු.92,571,415 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | ඉඩම් හා ගොඩනැගිලි සඳහා අයිතිය තහවුරු කරන ලේඛන ලබා ගත යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 126 (vii)(ඊ) වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉදිකර ඇති ප්‍රචාරක පුවරු සඳහා ගාස්තු අයකර ගැනීමට අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | 2022 වර්ෂයේ ගාස්තු අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ආදායම් පරීක්ෂක මගින් සිදුකිරිමට අපේක්ෂා කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුය. |
| (ii) | 182 වගන්තිය | හිඟ මස් කඩ කුලී රු.754,423 ක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඉල්ලා ඇති බව. | හිඟ ආදායම් කපා හැරීමට පෙර පූර්ව අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 1646 | සභාව සතු ධාවන තත්ත්වයේ පවතින වාහන 16ක් සඳහා දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නියමිත කාලයේ විගණනයට ඉදිරිපත් කරන බව. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,317,203ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,461,631ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" | රු. "000" |
| වරිපනම් හා බදු | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| කුලී | 13,150 | 5,804 | 5,450 | 4,028 | 14,500 | -- | 10,230 | 3,674 |
| බලපත්‍ර ගාස්තු | 1,200 | 704 | 710 | 145 | 1,503 | -- | 963 | 151 |
| වෙනත් ආදායම් | 1,722 | 995 | 995 | -- | 2,341 | -- | 522 | - |
| | **16,072** | **7,503** | **7,155** | **4,173** | **18,344** | **--** | **11,715** | **3,825** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු**<br>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) ප්‍රකාරව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි සංවර්ධිත ප්‍රදේශ නම් කර වරිපනම් බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | වරිපනම් බදු අය කර ගැනීමට මූලික කටයුතු ආරම්භ කර ඇති බව. | සංවර්ධිත ප්‍රදේශවලින් වරිපනම් බදු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ආ) කුලී**<br>වර්ෂ 03කට වඩා අධික කාලයක් හිඟහිටිව පැවැති සතිපොල කුලී රු.121,200 ක් විය. | හිඟ මුදල් වහාම ගෙවන ලෙසත්, හිඟ අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කරන බව. | හිඟහිටි කුලී ආදායම් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ඇ) මස්කඩ**<br>2017 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා මස්කඩ බදු කුලී වශයෙන් ලැබිය මුදල රු.3,906,962 ක් විය. | ඉදිරියේදී එම හිඟහිටි මුදල් ලබාගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟහිටි මස්කඩකුලී අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ඈ) මුද්දර ගාස්තු**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.4,082,928 ක් විය. නියමිත දිනට මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් 2020 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාලව අයකළ යුතු මුදල් පළාත් සභාවේ ආදායමට බැර කර තිබුණි. | 2018 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු අයකිරිමට පියවර ගෙන ඇති බව. | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 81 අනුව මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් 2012 වර්ෂයේදී කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබාගත් ණය රු.18,341,778ක් සහ 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය පොලී රු.4,476,269ක් ගෙවා නිරවුල් කිරීමට සභාව විසින් මෙම වාර්තාවේ දිනය දක්වා කටයුතු කර නොතිබුණි. | දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය සහ ඒ සඳහා පොලිය නොගෙවන්නේ සභාවේ ආදායම ඉතා අඩු බැවිනි. කෙසේ වෙතත්, එම ණය පියවීමට පියවර ගන්නා බව. | ණය සහ පොලිය ගෙවීමට සුදුසු පියවර ගත යුතුය. |
| (ආ) | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා 2021 වර්ෂයේ රු.1,000,000ක ප්‍රතිපාදන නිදහස් කර තිබූ නමුත්, සභාවට අයත් නොවන ඉඩමක ඒ සඳහා වැඩබිමක් සැකසීම සඳහා රු.803,520 ක් වැය කර තිබුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,500,000ක් පිරිවැය වූ කාබනික පොහොර නිෂ්පාදන යන්ත්‍රයක් මිලදී ගෙන ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ කිසිදු ප්‍රයෝජනයකින් තොරව තබා තිබුණි. | භාවිතා කිරීමට සුදුසු පියවර ගන්නා බව. | වත්කම් භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත දේපළ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.5,978,814ක වියදමින් ඉදිකර තිබූ තඹලගමුව ප්‍රාදේශීය සභාවේ පොදු වෙළෙඳ පොළ ගොඩනැගිල්ල කුලියට ලබාදී ආදායම් උපයා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | රටේ පැවැති ආර්ථික අර්බුදය හේතුවෙන් දිගින් දිගටම ලංසු කැඳවීම තුළින් එම ගොඩනැගිල්ල කුලියට දීමෙන් ආදායමක් ලබා ගැනීමට නොහැකි වූ අතර, 2023 වර්ෂයේ ආදායමක් ඉපැයීමේ අරමුණින් ලංසු කැඳවූ නමුත් ඉහත කී වෙළෙඳ පොළ ගොඩනැගිල්ල ලබාගැනීමට කිසිවකු ඉදිරිපත් නොවූ බව. | වත්කම්වලින් ආදායම් උපයා ගැනීමට සුදුසු පියවර ගත යුතුය. |

### 3.3 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් වාහන 04 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවැති අතර ඒවා අළුත්වැඩියා කිරීමට පියවර ගෙන නොතිබුණි. | අප සභාවට අයත් අළුත්වැඩියා කළයුතු වාහන 07කින් වාහන තුනක් දැනට භාවිතයට යොදවා ඇත. ඉතිරි වාහන අළුත්වැඩියාවන් සභාවේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගෙන නුදුරු අනාගතයේ දී ධාවනයට යොදවන බව. | භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග ලෙස ලැබුණු වාහන 02 ක අයිතීන් පවරාගෙන නොතිබුණි. | මෙම වාහනවල අයිතිය සභාවේ නමට මාරුකර ගැනීමේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින බව. | සභාවේ නමට මාරුකිරීමට කටයුතු සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවේ වාහන 23 ක් පැවැති නමුත් වාහන 08 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | දැනට භාවිතයේ පවතින සියළුම වාහන ඉදිරි දිනවලදී තක්සේරු කරන බව. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 58ක් දක්වා විචලනයන් වූයෙන් අයවැය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | පසුගිය වර්ෂයේ සිදුවූ ආර්ථික අර්බුදය හේතුවෙන් සිදුවූ මිල ගණන් වැඩිවීම සහ ආදායම් අයකර ගැනිමේදී සිදුවූ ගැටලු තත්ත්වයන් නිසා මෙවැනි තත්ත්වයක් ඇති වූ බව. | අයවැය තාර්කිකව පිළියෙල කිරිමට උචිත ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් සභා බලප්‍රදේශයේ එක් මසක් සඳහා ආසන්න වශයෙන් රැස්කරනු ලබන ටොන් 30ක පමණ කසල සහ ඝාතකාගාරයේ ඝාතනය කෙරෙන සතුන්ගේ අපද්‍රව්‍ය, A6 - නුවර පාර, සිංහකන්ද යන කැලෑ ප්‍රදේශයේ වර්ගීකරණය නොකර බැහැර කිරිම නිසා අලි ඇතුන් ඇතුළු අනෙකුත් සතුන්ට බලපෑම් සිදුවන අතර පරිසරයද දූෂණයට ලක්වී තිබුණි. | සභාවට ලබාගැනීමේ කටයුතු අවසන් වූ විගස, රැස්කෙරෙන කසල වර්ගීකරණය කර බැහැර කරන අතර පරිසර දූෂණයට ලක්නොවීමටත් අනෙකුත් සතුන්ට බලනොපාන පරිදිත් මෙය යෙදවිය හැකි බව. | පරිසරය ආරක්ෂා කිරීම අරමුණු කරගනිමින් උචිත ක්‍රියාමාර්ග ගත යුතුය. |